# ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
# தேசிய சம்பளங்கள் மற்றும் ஆளணி ஆணைக்குழு
# NATIONAL SALARIES AND CADRE COMMISSION

කාමර අංක 2-116, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව, බෞද්ධාලෝක මාවත, කොළඹ 07
அறை இல. 2-116,பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மாநாட்டு மண்டபம், பௌத்தாலோக மாவத்தை, கொழும்பு 07
Room No.2-116, B.M.I.C.H, Bauddhaloka Mawatha. Colombo 07

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 2669134 | ෆැක්ස්<br>பக்ச்<br>Fax | 2669134 | විද්‍යුත් තැපැල<br>மின்னஞ்சல்<br>E-mail | nscc@sltnet.lk |
| මගේ අංකය<br>எனது இல.<br>My No. | NSCC/5/31/SR-III | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | PSC/EST/02-01-34 /01/2019 | දිනය<br>திகதி<br>Date | 2019.06. 20 |


ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

<u>අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘති නිලධාරී තනතුර (MN-06) සඳහා වන උසස් කිරීමේ පරිපාටිය</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2019.06.10 දිනැති ලිපිය හා බැඳේ.

02. එමගින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘති නිලධාරී තනතුර (MN-06) සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019.05.30 දිනැතිව අනුමැතිය ලබා දී ඇති උසස් කිරීමේ පරිපාටියේ ඇතුළත් අන්තර්ග්‍රහණ විධිවිධාන සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ විමසා ඇත.

03. ඒ අනුව 2013.11.04 දින වන විට ව්‍යාපෘති නිලධාරී (නොවිධිමත් අධ්‍යාපන) තනතුරේ දෙවන කාර්යක්ෂමතා කඩඉම වන පශ්චාත් උපාධි සුදුසුකම ලැබීමෙන් පසු වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර ශ්‍රේණි උසස්වීම ලැබීම සඳහා වන අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නිලධාරීන් MN-06 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම හා පශ්චාත් උපාධි සුදුසුකම ලබා වසර 10 කට අඩු සේවා කාලයක් ඇති නිලධාරීන් II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම මෙම කොමිෂන් සභාව විසින් නිර්දේශ කෙරේ.

අ.ලේ/ කේ.එම්.ඩබ්. ප්‍රියදර්ශණි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්

අත්/කළේ: අනුර ජයවික්‍රම
ලේකම්
ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව.

පිටපත :-

1. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - මාගේ අංක NSCC/5/38/SR-II හා 2018.09.11 දිනැති ලිපිය අනුව කරු.දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස.
3. ලේකම්, අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධන ආංශික අධීක්ෂණ කාරක සභාව - 2019.06.04 දිනැති සාකච්ඡාව අනුව කරු.දැ.ගැ.ස.

COMMITTEE OFFICE 20 JUN 2019 PARLIAMENT OF SRI LANKA